

විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

**2020, 01 (01): 29-43**
ISSN: 2235-9001
Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ප්‍රවර්ගය සහ ශාස්ත්‍රීය නිර්වචන

**සෙනේෂ් දිසානායක බණ්ඩාර**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
seneshdissanaikebandara@sjp.ac.lk

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ප්‍රවර්ගය ස්ථාපනය වූයේ 1983දීය. එනම්, ''දිමුතු මුතු'' ටෙලි නාට්‍යය විකාශය වීමේ සිටය. ඒ අනුව ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' දශක හතරක කාලයකට ආසන්න දීර්ඝ ඉතිහාසයක් සතුය. 1947දී ''කඩවුණු පොරොන්දුව'' සිනමා කෘතිය ප්‍රදර්ශනය වූ දා සිට දශක හතක කාලයක් ඉක්මවන ලද මෙරට සශබ්ද සිනමාවද, 1950දී ''ගුවන් විදුලි රඟමඬල'' විකාශය වූ දා සිට දශක හතක කාලයක් ඉක්මවන ලද මෙරට රේඩියෝ නාට්‍යයද, අතර නව්‍ය විද්‍යුත් ජන මාධ්‍ය අන්තර්ගතයක් වශයෙන් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ප්‍රවර්ගය විසින් ජන මාධ්‍ය ග්‍රාහක අවකාශය තුළ හිමි කරගෙන ඇත්තේ තීරණාත්මක පංගුවකි. ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ප්‍රවර්ගයෙහි පරිණාමීය විශේෂතා පිළිබඳව අවධානය යොමු කරන විට මෙතෙක් අනාවරණය වී ඇති පූර්ව ශාස්ත්‍රීය අධ්‍යයන රාශිය අතුරින් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' නම් සුසාධිත දෘශ්‍ය කලා ප්‍රවර්ගයෙහි ස්වලක්ෂණ කවරේ දැයි අධ්‍යයනය කිරීම මඟ හැරී තිබේ. ඒ නිසාම මෙම පර්යේෂණය වඩාත් ශාස්ත්‍රීය වූ සාහිත්‍ය මූල පරිශීලනය සිදු කිරීම සඳහා දිශානතීන් හතරක් (04) වෙත ඉලක්කගත විය. එහිලා සාහිත්‍ය මූල පරිශීලනයේදී ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' සංකල්පනය කර ගැනීම පිණිස අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචන තිබේ නම් ඒ පිළිබඳව විශ්ලේෂණාත්මක විමර්ශනයද, ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍ය' ස්වලක්ෂණ තිබේ නම් ඒ බව නිශ්චය කොට ගැනීමට උපයෝගී වන ඊට පූර්වයෙහි පැවති අනුරූප ටෙලිවිෂන් වැඩසටහන් ප්‍රවර්ගවල ස්වලක්ෂණ සමඟ සන්සන්දනාත්මක විමර්ශනයද, ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍ය' ස්වලක්ෂණ අධ්‍යයනය කිරීමට ඉවහල් වන තද් දෘශ්‍ය කලා ප්‍රවර්ගයෙහිම උපයෝජිත ප්‍රායෝගිකත්වය පිළිබඳවද ටෙලිවිෂන් අධ්‍යයනයට විෂයගත සිද්ධාන්ත මත විග්‍රහාත්මක විමර්ශනයට මූලික විය. අනතුරුව, ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ප්‍රවර්ගයෙහි පරිණාමීය විශේෂතා කෙරෙන් ප්‍රකට වූ කිසියම් අනන්‍ය වූ ආවේණික ස්වලක්ෂණ තිබේනම් ඒවා සැබෑම අභිනව සුසාධිත දෘශ්‍ය කලා ප්‍රවර්ගයක ස්වලක්ෂණ ලෙස නිශ්චය කිරීමට සමත් වන්නේ දැයි ටෙලිවිෂන් අධ්‍යයනයෙහි විෂයගත සංකල්ප මත විග්‍රහාත්මක විමර්ශනය සිදු කිරීම සාහිත්‍ය මූල පරිශීලනයට දිශානතිය විය. මෙම ශාස්ත්‍රීය ලේඛනය සකස් වන්නේ ඒ අතුරින් පළමුවැන්න වූ ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' සංකල්පනය කර ගැනීම පිණිස අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචන තිබේ නම් ඒ පිළිබඳව විශ්ලේෂණාත්මක විමර්ශනය යන දිශානතිය පදනම් කොට ගෙනය.

**මූඛ්‍ය පදඃ** ශ්‍රී ලාංකේය ටෙලි නාට්‍යය, සාංකල්පික පදනම, ප්‍රායෝගික භාවිතය, නිර්වචන

## 1. ප්‍රවේශය

විද්‍යුත් ජන මාධ්‍ය ක්ෂේත්‍රයෙහි ටෙලිවිෂන් මාධ්‍යය විසින් ඉටු කරනු ලබන තොරතුරු සම්පාදනය සහ අධ්‍යාපනය ලබා දීම වැනි පුළුල් කාර්ය භාරය අතරේ වින්දනාස්වාදයද පිළිගත් පරමාදර්ශී අරමුණු අතර මූලික වන්නකි. ටෙලිවිෂන් මාධ්‍යයෙහි වින්දනාස්වාදය උදෙසාම ප්‍රමුඛ වන 'මාධ්‍ය කලාවක්' ලෙස පිළිගනු ලබන ටෙලිවිෂන් වැඩසටහන් ප්‍රවර්ගයක් ලෙස **'ටෙලිවිෂන් මාධ්‍යය උදෙසා නාට්‍ය'** හැඳින්විය හැකිය. 'ටෙලිවිෂන් මාධ්‍යය' නමැති ආකෘතිය සමඟ 'නාට්‍ය' නමැති අන්තර්ගතය සුසංයෝග කරමින් **'ටෙලි නාට්‍යය'** යන නාමකරණයෙන් 1983දී මෙරටදී ස්ථාපනය කරනු ලැබූ, ශ්‍රී ලාංකේය **'ටෙලි නාට්‍යය'** යන්න මාධ්‍ය කලාවක් සහ සංස්කෘතික කර්මාන්තයක් යනුවෙන් මේ වන තෙක් දශක සතරකට (04) ආසන්න කාලවකවානුවක් ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය අවකාශය තුළ නිරන්තරයෙන්ම සුවිශේෂ අවධානයක් ලබමින් පවතින්නක් බව නිරීක්ෂණය කළ හැකිය.

ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය අවකාශය තුළ ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' වෙත නිරන්තරයෙන් ලැබෙන අද්‍යතනයේ පවතින අවධානය යනු කලාතුරකින් ලබන ප්‍රශංසාත්මක ඇගැයීම්වලට වඩා කිහිප ගුණයකින් ලැබෙන විවේචනාත්මක පරිභවවලින් වැඩි පමණින් පිරුණක් බවද ප්‍රකට තත්ත්වයක් වේ.

ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ස්ථාපනය වූ මූලාරම්භයේ එනම්, වර්තමානයෙන් දශක සතරකට (04) ආසන්න කාලවකවානුවකට පෙරදී තාක්ෂණයේ සහ ශිල්ප විධිවල පැවති සීමා සහ අභියෝග හමුවේ වුවද, ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' විසින් ජන මාධ්‍ය ඇසුරු කරන ලද අභිනව මාධ්‍ය කලාවක් සහ සංස්කෘතික කර්මාන්තයක් පිළිබඳව සුභවාදී ස්වලක්ෂණ පෙන් වූ අතර, එතෙක් පැවති අනෙකුත් මාධ්‍ය කලා අතර අභිනවයෙන් බිහි වුවද එහි ආගන්තුකභාවය හමුවේ වුවද වෘත්තීයභාවයෙන් විදග්ධ මට්ටමක් සලකුණු කිරීමටද සමත් වූවක් බවට සාක්ෂි සහිතව සාධනය වී තිබේ.

දශක සතරකට ආසන්න දීර්ඝ කාලවකවානුවක් තුළ පරිණාමය සිදු වූ ඕනෑම කලාවක සහ සංස්කෘතික කර්මාන්තයක සාමාන්‍යයෙන් සිදු වන්නේ සමාරම්භයේ සිට ඉදිරියට ක්‍රමක්‍රමයෙන් යහපත් වර්ධනයක් ලැබීමකි. ඉනික්බිතිව ඊළඟ පියවර ලෙස එහි ශාඛා සහ අනුශාඛා ව්‍යාප්ත කරමින් තවදුරටත් නව ඉසව් කරා එළැඹෙන අභිවෘද්ධියම එවැන්නක් විසින් පෙන්නුම් කරනු ලබයි. අනෙකුත් සමාන්තර මාධ්‍ය කලා විසින් නම් එවැන්නක් දෘශ්‍යමාන කරනු ලැබූ නමුත් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' සම්බන්ධයෙන් අද්‍යතනයේ පවතින්නේ ස්ථාපනයේදී තිබූ දියුණු තත්ත්වයන්ගෙන්ද බැහැර වී ගිය, කිසිදු ලෙසකින් පුනරුත්ථාපනය කළ නොහැකි වන තරමේ පරිහානීය තත්ත්වයකට අවප්‍රමාණ වී ගිය ලක්ෂණ බවට අද්‍යතනයේ නිබඳව ලබන නිගරු ප්‍රතිචාරවලින් පැහැදිලි වශයෙන් නිරීක්ෂණය කළ හැකිය.

මෙවැනි පසුබිමකදී මාධ්‍ය කලාවක් ලෙස ඉතා උසස් මට්ටමකින් ස්ථාපනය වූ ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' වර්තමානයේදී පසුබෑමට ලක් වීම පිළිබඳව මෙරට සමාජ අවකාශයෙහි පවතින දැඩිතර විවේචනය ශාස්ත්‍රීය වශයෙන් සාධාරණද, එසේ සාධාරණ වේ නම් ඊට සහේතුකව බලපෑ කාරණා කවරේද, තවදුරටත් කලාවක් සහ සංස්කෘතික කර්මාන්තයක් වශයෙන් පැවතීමට ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යයට' සාධනීය අවස්ථාවක් තිබේද යන්න විශ්ලේෂණාත්මක විග්‍රහයකට යොමු කරවීම අවශ්‍යය.

ඒ අනුව, ස්වලක්ෂණ සහිත වූ සුසාධිත දෘශ්‍ය කලා ප්‍රවර්ගයක් ලෙස 1983දී බිහි වුවද, 1983 - 2013 යන දශක තුනක දීර්ඝ කාලවකවානුවක පරිණාමීය අවධියකින් පසුව කලාවක් සහ

සංස්කෘතික කර්මාන්තයක් වශයෙන් පෙන්විය යුතු වූ වර්ධනීය විශේෂතා කිසිවක් සමකාලීන ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' තුළ වර්තමානයේ දිස් නොවීම කෙරෙහි හේතු අධ්‍යයනය තුළ අවධාරණයෙන් ඉස්මතු කළ යුතු වැදගත් කරුණක් වශයෙන් දශක සතරකට ආසන්න දීර්ඝ කාලවකවානුවක් සහිත වූ ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' ප්‍රවර්ගයෙහිලා විශේෂතා ප්‍රකාශයෙහි සමත් කිසිදු අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් හෝ මෙතෙක් ඊට අදාළ වන අධ්‍යයන අවකාශය තුළ සම්පාදනය වී නොමැති බවය.

## 2. සාකච්ඡාව

### 2.1 ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' අරභයා අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචන

මෙහිලා, දශක හතරකට ආසන්න දීර්ඝ කාලවකවානුවක් තුළ දේශීයව පැවතියද ශ්‍රී ලාංකේය '**ටෙලි නාට්‍යය**' නමැති දෘශ්‍ය කලා ප්‍රවර්ගය යනු කවරේ දැයි ප්‍රකාශ වන අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් මෙතෙක් සපයා ගැනීමට නොමැත. සත්‍ය වශයෙන්ම එවැන්නක් හමු නොවේ. මෙතෙක් සිදු කරන ලද කිසියම් හෝ ශාස්ත්‍රීය අධ්‍යයනයක් මගින් එකදු නිර්වචනයක්වත් සම්පාදනය වී තිබුණා නම් එවැන්නක් පාදක කොට ගෙන ශ්‍රී ලාංකේය '**ටෙලි නාට්‍යය**' පිළිබඳව විග්‍රහාත්මක විමර්ශනයකට එළැඹීම පහසු වන්නට තිබිණ.

එමෙන්ම විදේශීයව තබා දේශීයවත් එවැනි නිර්වචනයක් සම්පාදනය නොවීමට බලපෑ ඇතැයි සැක කළ හැකි ප්‍රධානතම හේතු දෙකක් (02) පහත පරිදි සඳහන් කළ හැකිය.

- පළමුවැන්න ලෙස, ශ්‍රී ලාංකේය '**ටෙලි නාට්‍යය**' යනු මෙරට තුළ දේශීයව උද්භවය ලැබූවක් වූ බැවින් විදේශීය පර්යේෂකයන්ගේ ශාස්ත්‍රීය අධ්‍යයන සඳහා අවධානයට ලක් වීමට අවස්ථා නොලැබීමේ හේතු වශයෙන් විදේශීය වශයෙන් නිර්වචන සම්පාදනය වී නොතිබීම

සහ

- දෙවැන්න ලෙස, දශක හතරකට ආසන්න දීර්ඝ කාලවකවානුවක් තුළ දේශීයව පැවතියද ශ්‍රී ලාංකේය '**ටෙලි නාට්‍යය**' යනු අධ්‍යයන ක්ෂේත්‍රයක් වශයෙන් මෙරට ශාස්ත්‍රීය පර්යේෂණ අවකාශයෙහි අවධානයට පාත්‍ර වී නොතිබීම නිසාම විදේශීය වශයෙන් තබා දේශීය වශයෙන් පවා නිශ්චිතව හඳුන්වා දෙන ලද නිර්වචනයක් සම්පාදනය වී නොතිබීම

යනාදිය එයට මූලික හේතු වශයෙන් උපකල්පනය කළ හැකිය.

මෙරට බොහෝ ශාස්ත්‍රීය අධ්‍යයනවලට ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' පාදක වූවද, බොහෝ විට සිදු කරන අන්තර්ගත විශ්ලේෂණය කෙරෙහි සහ තවත් විටෙක සිදු කරන සමාජයට එහි ඇති මාධ්‍ය බලපෑම කෙරෙහි අවධානය කේන්ද්‍රගත වන විට ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' අරභයා අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචන සම්පාදනය වීම මඟ හැරී යාමට වැඩි ඉඩක් පවතී.

එහෙත් මෙම අධ්‍යයනයේ අරමුණ අනුව නියත වශයෙන්ම ශ්‍රී ලාංකේය '**ටෙලි නාට්‍යය**' යනුවෙන් සංකල්පනයක් සකස් කොට ගැනීම මූලික අවශ්‍යතාවක් වී තිබේ. එම නිසා ඒ පිණිස පාදක කොට ගත හැකි ශාස්ත්‍රීය වශයෙන්

අර්ථ සම්පන්න නිර්වචනයක් සොයා ගවේෂණය සිදු කළ යුතු විය. නොඑසේ නම් මෙම අධ්‍යයනය පිණිස ඵලදායි වන හැකි පමණ අත්‍යයන්තයෙන් ගැළපෙන නිර්වචනයක් සකස් කොට ගත යුතුය. මෙම අභියෝගය අසීරු නමුත් කිසියම් න්‍යායාත්මක ආස්ථානයක සිට ඊට ප්‍රවේශයක් ගැනීම මේ සඳහා අත්‍යවශ්‍ය වී තිබේ. මේ සඳහා පියවර කිහිපයක් සහිත වූ ප්‍රවේශයක් සැලසුම් කළ හැකි අතර, එකී කාර්යය වඩාත් න්‍යායාත්මක පසුතලයක පිහිටුවා ගැනීම අනිවාර්යය විය.

මේ සඳහා නිශ්චිත වශයෙන් අර්ථ විග්‍රහයෙහි සමත් වන කිසියම් සාංලක්ෂයීය විඥාපනයක් සහිත වූ නිර්වචනයක් සංග්‍රහ කර ගැනීම පිණිස මූලික පියවර දෙකක් ඇසුරෙන් පරිපාකයට පත් වන අවසන් පියවර සහිත වූ ප්‍රවේශයක් උපයෝගී කර ගැනිණ.

එහිලා පූර්වෝක්ත පදනම ඇසුරෙන් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යනු කුමක් දැයි දක්විය හැකි අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් පිළිබඳව විමර්ශනය කරනු පිණිස මූලික පියවර ද්වයය වශයෙන්

- **නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් 'ටෙලිවිෂන් මාධ්‍යය' අධ්‍යයනය කිරීම**
- **නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් 'නාට්‍යය' අධ්‍යයනය කිරීම**

සහ එකී මූලික පියවර ද්වයය ඇසුරෙන් පරිපාකයට පත් වන අවසන් පියවර වශයෙන්

- **නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් 'ටෙලි නාට්‍ය' අධ්‍යයනය කිරීම**

යනුවෙන් වූ ප්‍රවේශය මත විමර්ශනය සිදු කෙරිණ.

### 2.1.1 නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් 'ටෙලිවිෂන් මාධ්‍යය' අධ්‍යයනය කිරීම

නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් **'ටෙලිවිෂන් මාධ්‍යය'** අධ්‍යයනය කිරීම පිණිස මූලික පියවර දෙකෙහි පළමුවැන්න ලෙස ටෙලිවිෂන් මාධ්‍ය පිළිබඳව නිබඳවම ශාස්ත්‍රීය අධ්‍යයනයට පාදක වන මාධ්‍ය ශාස්ත්‍රඥයකු සහ අමෙරිකානු ජාතික සන්නිවේදන ඉතිහාසඥ අමෙරිකා එක්සත් ජනපදයේ ඉන්ඩියානාහි බට්ලර් විශ්වවිද්‍යාලයේ සන්නිවේදන කොලීජියේ මහාචාර්යවරයකු වන ආචාර්ය ගැරී ආර්. එඩ්ජර්ටන් (2010) විසින් සන්නිවේදන ඉතිහාසය පිළිබඳව සිදු කරන ලද ශාස්ත්‍රාලයීය ගවේෂණයද මූලය කොට ගැනිණ.

ගැරී ආර්. එඩ්ජර්ටන් එඩ්ජර්ටන් (2010) සිය The Columbia History of American Television කෘතියෙන් දක්වන පරිදි ලෝක ඉතිහාසයෙහි 'ටෙලිවිෂන් මාධ්‍යය' ස්ථාපනය සිදු කිරීම යනු මානව සංහතිය විසින් දැවැන්ත පියවරක් ඉදිරියට තැබීමක් වේ.

> "ටෙලිවිෂන්" යන්න සංකල්පයක් වශයෙන් මානව සමාජයට පිවිසෙන්නේ සමාජ අවශ්‍යතාවක් ඉටු කිරීමේ 'තාක්ෂණික පැවරුමක්' වශයෙනි. එනම්, ක්‍රිස්තු වර්ෂ 1900 වර්ෂයේ දී ප්‍රංශයේ පැරිස් නගරයේ පැවැත් වූ 'ලෝක වෙළඳ ප්‍රදර්ශනය' සමඟ සංවිධානය කරන ලද 'විදුලි තාක්ෂණය පිළිබඳව පළමුවෙනි අන්තර්ජාතික සමුලුවේ' දීය. එහි 1900 අගෝස්තු 31 දින පැවැත් වූ සැසි වාරයේදී 'දුරක පිහිටි ස්ථානයක සිදු වන කිසියම් කටයුත්තක්, එයින් ඈත වෙනත් ස්ථානයක සිටිමින් නැරඹීමේ මානව අත්දැකීමක්' වන 'සංකල්පයක්' පිළිබඳව රුසියානු ජාතික භෞතික විද්‍යාඥ කොන්ස්ටන්ටින් පර්ස්කි සිය "*télévision* by means of Electricity" නමැති දේශනයේදී ඉදිරිපත් කළේය. මෙම 'සංකල්පය' දිනෙක යථාර්ථයක් වීම යනු විද්‍යා සහ

තාක්ෂණ විෂය ක්ෂේත්‍රයෙහි සමකාලීනයන් වටහා ගත්තේ සමාජ අවශ්‍යතාවක් ඉටු කරවා දීමකට වඩා, මානව සමාජය යෝධ පියවරක් ඉදිරියට තැබීමක් වශයෙනි (Edgerton, 2010, p. 24)."

මානවයා සිය ශ්‍රම ශක්තියෙන් සීමිත ප්‍රමාණයක් භාණ්ඩ නිෂ්පාදනය සිදු කිරීම වෙනුවට යන්ත්‍ර සූත්‍ර යොදා ගෙන මහා පරිමාණයෙන් භාණ්ඩ නිෂ්පාදනය කරමින් විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති කළ පුළුල් සුසමාදර්ශ පරිවර්තනය වන කාර්මික විප්ලවය යුරෝපයේ ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතුව වෙළඳාමයි. 18 වෙනි සියවස අග භාගයේදී පේෂ කර්මාන්තය, යකඩ හා වානේ කර්මාන්තය සමඟ ගල් අඟුරු කර්මාන්තය ඔස්සේ බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ වී එතැන් සිට තවත් අඩ සියවසක් පමණ ගත වන තෙක් කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයට සීමා වී තිබුණද පසුව 19 වෙනි සියවස වන විට යුරෝපයේ සෙසු රටවලට මෙන්ම ලෝකයේ වෙනත් රටවලටද කාර්මික විප්ලවයේ බලපෑම පැතිරුණි.

තත්කාලීනව ඉදිරියට සිදු වනු ලබන 'කාර්මික විප්ලවය' නිසා මානව සමාජයට දායාද වූ යන්ත්‍රෝපකරණ රාශීය සහ ඒවා මගින් සමාජයට සහ දේශපාලනයට මෙන්ම සාහිත්‍යයට සහ කලාවටත් ඇති කරවන ලද බලපෑම් විවිධ වේ. ඒවා අතුරින් ලෝක සාහිත්‍ය ඉතිහාසයට 'විද්‍යා සාහිත්‍යය' නම් වූ කිසියම් නව ප්‍රවණතාවක් අභිනවයෙන් එකතු වී වේගයෙන් පැතිරයාමට හේතු වූයේද කාර්මික විප්ලවයෙහි පසුබිමය.

> "පෙර කී සංකල්පය 'ටෙලිවිෂන්' යනුවෙන් පළමුවෙනි වරට මුද්‍රිත මාධ්‍යයේදී හමුවන්නේ 1907දී පළ කරන ලද Scientific American විද්‍යා සාහිත්‍ය සඟරාව සඳහා ජර්මානු ජාතික භෞතික විද්‍යාඥ ආතර් කොර්න් විසින් සංකල්ප ගත කරන ලද "The Problem of Television" නමැති ලිපියේය (Edgerton, 2010, p. 24)."

මේ අනුව 'දුරක පිහිටි ස්ථානයක සිදු වන කිසියම් කටයුත්තක්, එයින් ඈත වෙනත් ස්ථානයක සිටිමින් නැරඹීමේ අත්දැකීමක්' මානව සමාජයට ලබා ගත හැකි මෙවලමක් ඇත්නම් එය 'ටෙලිවිෂන්' යනුවෙන් නාම පදයකින් පළමුවෙනි වතාවට මුද්‍රිත මාධ්‍යයෙහිදී හමුවන්නේ විද්‍යා සාහිත්‍ය සඟරාවක් තුළය.

පැට්‍රික් හැන්ක්ස් (2013) විසින් තම Lexical Analysis: Norms and Exploitations කෘතියෙන් දක්වා ඇති පරිදි 'දර්ශන හෝ රූප දුරකට සම්ප්‍රේෂණය සිදු කිරීම' නොහොත් 'දුරකට දර්ශනය වීම' නමැති අරුතින් *Television* නම් පදය ඉංග්‍රීසි භාෂාවට ලැබෙන්නේ [ ***ῆλε (tèle) (ටෙලි)* + *visio (විසියෝ)* = *television (ටෙලිවිෂන්)*** ] යනුවෙන් පිළිවෙළින් ග්‍රීක භාෂාවේ සහ ලතින් භාෂාවේ පද දෙක *"télévision"* යනුවෙන් මූලිකවම ප්‍රංශ භාෂාව වෙනුවෙන් සුසංයෝග කරවා ගැනීමේ ප්‍රතිඵලයකින් බවය. ඒ සඳහා රුසියානු ජාතික භෞතික විද්‍යාඥ පර්ස්කි විසින් පැරිසියේදී ඉදිරිපත් කරන ලද දේශනයට පාදක වූ *"télévision"* නමැති සංකල්පය ලෝකය පුරා ප්‍රචලිතව පැතිර යාම හේතු වූ බවය.

> "දුරක පිහිටි ස්ථානයක සිදු වන කිසියම් කාර්යයක්, එයින් ඈත වෙනත් ස්ථානයක සිටිමින් නැරඹීමේ අත්දැකීම ලැබෙන 'මාධ්‍යය' වශයෙන් ජෝන් ලොගී බෙයාර්ඩ් විසින් පර්යේෂණ සිදු කරන ලද "Transmitting views or images to distance" යනුවෙන් 'දර්ශන හෝ රූප දුරකට සම්ප්‍රේෂණය සිදු කිරීම' උදෙසා නිපදවන ලද යාන්ත්‍රික ටෙලිවිෂන් යන්ත්‍රයක් විය (Hanks, 2013, p. 242)."

මෙම සංකල්පයටම විකල්ප භාෂාමය නාමකරණ වශයෙන් 1880 ගණන්වල අවසාන දශකයේදී *telephote* සහ 1900 ගණන්වල පළමුවෙනි දශකයේ දී *televista* නමැති වෙනත් පද දෙකක් ව්‍යවහාරයට පැමිණියද, *television* නමැති පදයෙහි ආගමනය හේතුවෙන් එය අන් සැමට වඩා ව්‍යවහාරය තුළ තහවුරු විය. එබැවින් අනෙකුත් ඒවා නොබෝ කලකින් භාවිතයෙන් ඉවත්ව ගොස් තිබේ.

මේ අතර *television* නමැති පදයෙහි ව්‍යවහාරය පසුකාලීනව කෙටි කර ගැනීමෙන් 1930 ගණන්වලදී බ්‍රිතාන්‍යයන් විසින් *telly* නමැති පදය සහ 1950 ගණන්වලදී අමෙරිකානුවන් විසින් *tv* නමැති පදය කෙටි යෙදුම් වශයෙන් එදිනෙදා ව්‍යවහාරයට පිළිවෙළින් යොදා ගෙන තිබෙන බව සන්නිවේදන ඉතිහාසඥයන්ගේ අදහසය.

'ටෙලිවිෂන් මාධ්‍යය' යනුවෙන් ප්‍රායෝගිකව පවතින පුළුල් විෂය ක්ෂේත්‍රය යනු 'ටෙලිවිෂන්' 'Television' නමැති පදය මගින් ප්‍රකට කරනු ලබන අර්ථ රාශියකින් යුක්ත වන නාමකරණයක් සහිත වූවක් වේ.

- ගෘහයක තිබෙන ටෙලිවිෂන් ග්‍රාහක යන්ත්‍රයද 'ටෙලිවිෂන්' යනුවෙන් එදිනෙදා ව්‍යවහාරයේදී හඟවනු ලබන අතර ;
- එමෙන්ම ගෘහයේ තිබෙන ටෙලිවිෂන් ග්‍රාහක යන්ත්‍රයෙන් ප්‍රදර්ශනය සිදු වන වැඩසටහන්ද 'ටෙලිවිෂන්' යනුවෙන් ජන මාධ්‍ය ක්ෂේත්‍රය තුළ හඟවනු ලබන අතර ;
- ටෙලිවිෂන් ග්‍රාහක යන්ත්‍රයෙන් ප්‍රදර්ශනය වන වැඩසටහන් නිර්මාණය කිරීම මෙන්ම නිෂ්පාදනය කිරීමද 'ටෙලිවිෂන්' යනුවෙන් අදාළ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ හඟවනු ලබන අතර ;
- ටෙලිවිෂන් ග්‍රාහක යන්ත්‍රයෙන් ප්‍රදර්ශනය වන වැඩසටහන්, සම්ප්‍රේෂණය කිරීමේ තාක්ෂණය යොදා ගෙන විකාශන මධ්‍යස්ථානයක සිට විකාශය කරවීමද 'ටෙලිවිෂන්' යනුවෙන් තදනුබද්ධ තාක්ෂණවේදය තුළ හඟවනු ලබන අතර ;
- මේ සියල්ලම ඒකරාශී වීමෙන් ජාලගත වන සමස්ත අවකාශයටද 'ටෙලිවිෂන්' මෙන්ම 'ටීවී' යනුවෙන් පොදු වූ නාමකරණයකින් ආමන්ත්‍රණය කරනු ලැබේ (Oxford Dictionary of Film Studies, 2012, pp. 424-425).

දශක ගණනාවක් තිස්සේ සිදු කළා වූ දිගු කාලයක තාක්ෂණික පර්යේෂණාවලියක් අවසානයේදී ලබන සාර්ථක ප්‍රතිඵලය සාක්ෂාත් කොට ගත් ස්කොට්ලන්ත ජාතිකයකු වූ ජෝන් ලොගී බෙයාර්ඩ් (1988 අගෝස්තු 13 - 1946 ජූනි 14) නමැති ඉංජිනේරුවරයාහට පේටන්ට් හිමිකම ලබා දෙමින් කාර්මික විප්ලවයේ දායාදයක් ලෙස මානව ඉතිහාසයට එක් වූ තවත් නවෝත්පාදනයක් වශයෙන් අභිනවයෙන් අත්පත් කරවා දෙන ලද ටෙලිවිෂන් ග්‍රාහක යන්ත්‍රය 1926 ජනවාරි 26 දින එංගලන්තයේදී බිහිව තිබේ.

> "1926 ජනවාරි 26 දින ඔහු විසින් ලන්ඩන් නගරයේ ෆ්‍රිත් මාවතේ තමන්ගේ පර්යේෂණාගාරයේදී ඔහු විසින් හඳුන්වා දුන් බව ඉතිහාසගත වී තිබේ (McLean, 2000, p.39)."

යුරෝපා මහද්වීපයට අයත් එංගලන්තයෙහි ටෙලිවිෂන් ග්‍රාහක යන්ත්‍රය බිහි වුවද, එහි මාධ්‍යය නොහොත් **'ටෙලිවිෂන් මාධ්‍යය'** වඩාත් ශීඝ්‍රයෙන් ව්‍යාප්තව ගියේ අමෙරිකා එක්සත් ජනපදයේය.

1895 දෙසැම්බර් 28 දිනැති පේටන්ට් හිමිකම ප්‍රංශ ජාතික ඕගස්ටේ සහ ලුයී ලුමියේ සහෝදරයන් සතු කරමින් ස්ථාපිත වූ **සිනමා** මාධ්‍යය සතුව පැවතියා වූ දෘශ්‍ය රූපය පාදක කොට ගන්නා ලද

(visual based), දෘශ්‍යගෝචර වූ (visual oriented) ප්‍රකාශනයෙහිලා සමත් බව ටෙලිවිෂන් මාධ්‍යයද සතු වූ නමුත්, කලාවෙහි සහ සෞන්දර්යයෙහි මූලිකාංග ඇසුරෙන් අනන්‍ය වූ ආවේණික ස්වලක්ෂණ සහිත වූ 'කලා මාධ්‍යයක්' බවට පත් වීමේ මහඟු අවස්ථාව එය කෙරෙන් මඟ හැරී ගොස් තිබේ.

'කලා මාධ්‍ය' සහ 'මාධ්‍ය කලා' යනුද වෙනස් අර්ථ දෙකක් සපයන යෙදුම් දෙකකි. එය වටහා ගනු පිණිස මුලින්ම 'කලාව' සහ 'මාධ්‍ය' යන යෙදුම් දෙකෙහි වෙනස වටහා ගැනීම පිණිස මානව සමාජයේ ඉතිහාසය තුළ ඒවා ස්ථාපනය වන ආකාරය අධ්‍යයනය කිරීම වැදගත් වේ.

මානව සංහතියේ සමාරම්භයේ සිටම ඔවුන්ගේ නිසග නිර්මාණශීලී ස්වභාවය නිසාම වින්දනාස්වාදය පිණිස 'කලාව' යනුවෙන් පැවති විවිධ ප්‍රකාශන විධි මානව සමාජයට ආගන්තුක නොවූ බවට ඓතිහාසික මෙන්ම ප්‍රාග් ඓතිහාසික සාධක සහ සාක්ෂි පවතින නමුත්, මානව සංහතිය වෙත සන්නිවේදනය උදෙසා 'මාධ්‍ය' යනුවෙන් නව අත්දැකීමක් අත්වන්නේ විද්‍යා සහ තාක්ෂණය දියුණුවේ ප්‍රතිඵලයක් නිසා බව සන්නිවේදන ඉතිහාසඥයන්ගේ පොදු අදහසයි. එනම් 'කලාව' පිළිබඳව ඉතිහාසය නිශ්චිතව දැක්විය හැකි නොවන තරම් ඈත අතීතයකට දිවෙන නමුත් 'මාධ්‍ය' පිළිබඳව ඉතිහාසය නිශ්චිතව දැක්විය හැකි තරම් මෑතාසන්නයේදී වාර්තා වී ඇති බව සාමාන්‍ය පිළිගැනීමයි.

'කලා මාධ්‍ය' යනු කිසියම් කලාත්මක ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස විස්තර කළ හැකි අතර, 'කලාව' යන්න කිසියම් 'මාධ්‍යයක්' ඔස්සේ ඉදිරිපත් කළ හැකි ලෙස වටහා ගත හැකි වේ. සිනමාව, රේඩියෝ සහ ටෙලිවිෂන් වැනි ජන මාධ්‍ය ඇසුරේ නිර්මාණශීලී කලාකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන කලාත්මක ප්‍රකාශන යනු 'මාධ්‍ය කලා' (Media Arts) ලෙස හැඳින් වේ. එනම්, මාධ්‍ය තුළින් සිදු කරන කලාත්මක ප්‍රකාශනයයි.

විද්‍යුත් ජන මාධ්‍යයක් වන ටෙලිවිෂන් මාධ්‍යය විසින් ඉටු කරනු ලබන තොරතුරු සම්පාදනය සහ අධ්‍යාපනය ලබා දීම වැනි පරමාදර්ශී අරමුණු අතර වින්දනාස්වාදයද මූලික වන්නේ එබැවිණි. ඒ සඳහා යොදා ගැනෙන 'මාධ්‍ය කලා' යනු එකී ප්‍රකාශනයෙහි ආකෘතිය බවට ජන මාධ්‍ය පත් කරගත්තා වූ කලාත්මක අන්තර්ගත ඉදිරිපත් කිරීමයි. එනම් ජන මාධ්‍ය ඇසුරෙහි කලා භාවිතාවයි. කලාව යනු කුමක් දැයි යන්න අවබෝධ කර ගැනීම මෙහිලා අත්‍යවශ්‍ය වේ.

එදිරිවීර සරච්චන්ද්‍ර (1995) විසින් සිය **කලාව යනු කුමක් ද?** ශාස්ත්‍රීය ලිපියෙහි මෙහිලා විෂයගත වන 'කලාව භාවිතය සහ සේවනය කිරීම' යන්න සවිස්තරාත්මකව විමර්ශනයට ලක් කොට තිබේ.

> " 'කලාව ජීවිත විවරණයකි' යන්න නොයෙක් විට ප්‍රකාශ කරනු ලැබේ. කලාව ජීවිතය කෙරෙහි කවර ආකාරයෙන් බල පායිද කියා මෙහිදී පහදා දීමට අපි වෑයම් කරමු. මෙහිදී කලාව කියන විට අප අදහස් කරන්නේ කුමක් දැයි පළමුවෙන් පැහැදිලිව කිව යුතුය. මෙහිදී කලාව යයි හඳුන්වන්නේ කලාකෘතියක් යයි හැඟේ. එනම් විශේෂයෙන් නිර්මාණාත්මක කෘති විය යුතුය; එනම් එම ගණයට අයිත වෙනත් නිර්මාණ මෙහිදී විග්‍රහ කොට බැලිය යුතුය. කලා කෘති සත්‍යයටත් මිථ්‍යාවටත් අතර තිබෙන්නක් බැවින් එය ග්‍රාහක අන්තරාත්මයට පිවිස ඔහුගේ සිතුම් පැතුම්, චර්යා ධර්ම යනාදී සියල්ලක්ම හැඩ ගැස්වීමෙහි සමත් බලවේගයක් බවට පත් වේ. එහි ආභාසයෙන් ඔහු යහපත් කෙනෙකු බවට පත් වන්නට පුළුවන්, නැතහොත් දුෂ්ට කෙනෙකු බවට පරිවර්තනය වන්ට පුළුවනි. මේ ආදී වසයෙන් කෙනෙකු තුළ සදාචාරය රෝපණය කිරීම හෝ කෙනෙකු තුළ පාපී චේතනා රෝපණය කිරීම හෝ එම කල්පිත කෘතියෙන් සිදු විය හැකි බව වටහා ගත මනාය. ජීවිතයේ සැබෑ තත්ත්වය විග්‍රහ නොකරන හුදු නිර්මාණවලින් නියම ජීවිත විවරණයක්

සිදු නොවන බව කිව යුතුය. තත්වානුකූල ජීවිත විවරණයක් ඉදිරිපත් වන්නේ ඉහළ මට්ටමේ නිර්මාණවලින්ය. ඒවායේ ශ්‍රේෂ්ඨ පරමාර්ථවලින් පෙලඹෙන චරිත නිරූපණය වේ. එවැනි අය ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ලෙස හඳුනා ගත හැකිය. ඔවුහු අපේ සදාතන මිත්‍රයෝ වෙති. ඔවුන්ගේ යාම් ඊම් ඔවුන් අගය කරන දේ ඔවුන්ගේ චර්යාධර්ම පාඨකයන්ගේ සිත් සතන්, ඔවුන්ගේ ආකල්ප ආදිය කෙරෙහි බලපාන්ට පිළිවන. කලාව ජීවිත විවරණයක් යයි අප විසින් විග්‍රහ කොට දක්වන ලද්දේ මේ අර්ථයෙන් බව සටහන් කරනු කැමැත්තෙමි (සරච්චන්ද්‍ර, 2010, පි. 16-17)."

මේ අනුව ජන මාධ්‍යයක් තුළ වුවද කලා මාධ්‍යයක පැවැත්මක් මෙන්ම කලා සේවනයක් වෙනුවෙන් අවකාශය තිබිය හැකිය. එහෙත් හුදු 'ජන මාධ්‍යයක්' වශයෙන් පමණක්ම වර්ධනය වීමට ටෙලිවිෂන් මාධ්‍යයට සිදු වන්නේ සමකාලීන නවෝත්පාදන ලෝකයෙහි පැවති ජන මාධ්‍ය මෙවලම් අතර ජනසන්නිවේදනය යන්න ව්‍යාපාරකරණය කොට ගත් ප්‍රජාව අතර ජනප්‍රියත්වයෙහි ප්‍රමුඛස්ථානයට පත් වූ **'ශ්‍රව්‍ය දෘශ්‍ය ජන මාධ්‍යය'** (Audio Visual Mass Medium) වශයෙන් පැවතීමේ සහ කටයුතු කිරීමේ 'වගකීම' අමෙරිකා එක්සත් ජනපදය විසින් භාර දෙන ලද නිසාය.

ඒ සඳහා හේතු වූයේ 1897 ජූලි 2 දිනැති පේටන්ට් හිමිකම ඉතාලි ජාතික ගුග්ලියෙල්මෝ මාර්කෝනි සතු කරමින් ස්ථාපිත වූ එනම්, ටෙලිවිෂන් මාධ්‍යය බිහි වීමට පෙර දශක දෙකකට (02) ආසන්න කාලයක් පුරා ශ්‍රව්‍යගෝචර වූ 'කලා මාධ්‍යයකට' වඩා ශ්‍රව්‍යගෝචර වූ 'ජන මාධ්‍යයක්' ලෙස පැවතියා වූ **රේඩියෝ** මාධ්‍යය යන්නෙහි දිගුවක් වශයෙන්ම ටෙලිවිෂන් මාධ්‍යය ද ශ්‍රව්‍ය සහ දෘශ්‍ය වශයෙන් උභයගෝචර වූ 'ජන මාධ්‍යයක්' ලෙස පිළිගන්නා ලද තත්ත්වයකට එළැඹීම බව සන්නිවේදන ඉතිහාසඥයන්ගේ මතය වේ.

"මූලාරම්භයේ දී 'නිහඬ සිනමාව' ලෙස පවතිමින් 'දෘශ්‍ය මාධ්‍යයක්' පමණක් වූ සිනමා මාධ්‍යය යනු කලාත්මක ප්‍රකාශනයකට දැවැන්ත අවකාශයක් සපයන අසීමිත අවකාශයක් සහිත වූ **පුළුල් තිරය** (Big Screen) බවට පත් වීමත්, එමෙන්ම 'ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක්' වූ නමුත්, ටෙලිවිෂන් මාධ්‍යය යනු එවැනි කලාත්මක ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශනයකට අවස්ථාව දිය හැකි තරම් අවකාශයක් නොලද, සීමිත වූ **පුංචි තිරය** (Small Screen) බවට පිළිගැනීමත් සිදු විය. එමෙන්ම 'කලාව' උදෙසා පවතින මාධ්‍ය වශයෙන් කාලාන්තරයක් තිස්සේ පවත්වා ගත් නමුත් පසුකාලීනව ලාභය අරමුණු කොට ගත් ව්‍යාපාර බවට පත් වූ හොලිවුඩ් සිනමාව හෝ බ්‍රෝඩ්වේ සහ එවැනි සංගීතමය නාට්‍යය මෙන්ම වේදිකා නාට්‍යය අතරට 'කලා මාධ්‍යයක්' වශයෙන් පිවිසීමට ටෙලිවිෂන් මාධ්‍යයට කිසි කලෙකත් අවස්ථාව නොලැබිණි (Edgerton, 2003, p. 59)."

මෙකී ඓතිහාසික මූල අධ්‍යයනයට අනුව 'ටෙලිවිෂන්' යන්න ස්ථාපනයේදීම,

- කාර්මික විප්ලවයෙහිම ප්‍රතිඵලයක් වූද, එකී ප්‍රවණතාවයෙහිම තවත් සොයා ගැනීමක් ලෙස විද්‍යා සහ තාක්ෂණ නවෝත්පාදනයක් වශයෙන් බිහි වූවක් බවටද,
- ඒ වන විට පැවති ශ්‍රව්‍යගෝචර වූ රේඩියෝ මාධ්‍යයෙහිම දිගුවක් ලෙසට පිළිගත් බැවින්, රේඩියෝ මාධ්‍යයෙහි පැවති අන්තර්ගත ගළපා ගෙන අනුවර්තනය කොට ගැනීමට සිදු වූයෙන්, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ගෝචර වූ ජන මාධ්‍යයක කාර්යභාරය එයට පැවැරුණු බවටද,

සහ

- ඒ වන විට පැවති දෘශ්‍ය ගෝචර වූ සිනමා මාධ්‍යයට සාපේක්ෂව එහිම කුඩා අනුරුවක් යැයි වරනැගීමෙන් තත්ත්වයෙන් අවප්‍රමාණ වීම නිසා, කලාත්මක ප්‍රකාශනයක් සිදු කිරීම සඳහා

ඇති අවකාශය සීමිත යැයි සලකමින්, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ලෙස උභයගෝචර වූ නමුත් කලා මාධ්‍යයක් ලෙස ස්ථාවර වීමේ අවස්ථාව ටෙලිවිෂන් මාධ්‍යයට නොලැබී ගිය බවටද,

විමර්ශනය කළ හැකිය.

ඒ අනුව මානව සංහතිය සතුව පැවති පළමුවෙනි ජන මාධ්‍යය වූයේ එතෙක් පැවති **මුද්‍රිත ජන මාධ්‍යය** (Print Mass Medium) වූ පුවත්පතය.

ඉන්පසුව මානව සංහතිය වෙත ප්‍රවේශ වන **විද්‍යුත් ජන මාධ්‍යය** (Electronic Mass Media) අතර පළමුවෙනි විද්‍යුත් ජන මාධ්‍යය වශයෙන් 'ශ්‍රව්‍ය ගෝචර විද්‍යුත් ජන මාධ්‍යය' ලෙස රේඩියෝ මාධ්‍යයද, එයින් පසුකාලීනව ප්‍රවේශ වන ඊළඟ විද්‍යුත් ජන මාධ්‍යය වශයෙන් 'ශ්‍රව්‍ය දෘශ්‍ය ගෝචර විද්‍යුත් ජන මාධ්‍ය' ලෙස ටෙලිවිෂන් මාධ්‍යයද මානව ඉතිහාසයේ වාර්තා ගතව තිබේ.

### 2.1.2 නිර්වචනයෙහිලා අධ්‍යයනය කළ හැකි සංකල්පයක් වශයෙන් 'නාට්‍යය' අධ්‍යයනය කිරීම

අනෙකුත් සත්ත්ව විශේෂයන්ට නොතිබුණු අර්ථ හුවමාරු කොට ගැනීම සඳහා වූ 'සන්නිවේදනය' සහ 'ප්‍රකාශනය' වැනි බුද්ධි ගෝචර කාර්යයන් ඵලදායී වශයෙන් සිදු කිරීමේ ශක්‍යතාවකින් හෙබි මානව සංහතිය තම මූලාරම්භයේ සිටම එවැනි උවමනාවකින් සිය පෙළුණු බවට මානවවිද්‍යා ඉතිහාසඥයින්ගේ මතවාද පවති.

කලාත්මක ප්‍රකාශනයක් කිරීමේ හැකියාව මෙන්ම එවැනි ප්‍රකාශනයක යෙදීමේ සන්නිවේදනයක උවමනාව ඇති එකම සත්ත්වයා මෙන්ම එකී කලාත්මක ප්‍රකාශනයක් සංජානනය කිරීමේ හැකියාව මෙන්ම සංජානනයට උවමනාව ඇති එකම සත්ත්වයා යනු මානවයා බවට සනාථ වී තිබේ.

මානව ඉතිහාසය තුළ කලාත්මක ප්‍රකාශනයක් ලෙස 'සන්නිවේදනය' සහ 'ප්‍රකාශනය' උදෙසා ඵලදායීත්වයෙන් යුතුව යොදා ගත හැකි වූ කිසියම් වූ ක්‍රියාකාරකමක් සේ පැවැතියා වූ 'නාට්‍යය' (Drama) ද, මානව සංහතියේ වර්ධනයත් සමගම සෞන්දර්යාත්මක විෂයයක් වශයෙන් ක්‍රමක්‍රමයෙන් ශිෂ්ටත්වය මගින් උත්කෘෂ්ටත්වයට පත් කරවූවක් බව සෞන්දර්ය ඉතිහාසඥයන්ගේ මතය වේ. 'නාට්‍යය' සම්බන්ධයෙන් දෙස් විදෙස් මත රාශියකි.

මූලික පියවර දෙකෙහි දෙවැන්න ලෙස නිර්වචනයක් සම්පාදනය කරගනු පිණිස සංකල්පයක් වශයෙන් **'නාට්‍යය'** පිළිබඳව නිබඳවම ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කොට එය උද්ධරණය කර ඇති දේශීය ශාස්ත්‍රඥයන් අතර මහාචාර්ය සුචරිත ගම්ලත් ප්‍රමුඛ වේ.

සුචරිත ගම්ලත් (1989) විසින් පළ කරන ලද **බටහිර නාට්‍ය හා රංග කලාව** කෘතියෙහි **නාට්‍යය** යන්න පෙරදිග සහ බටහිර සංකල්ප ඇසුරෙන් හඳුන්වා දී තිබේ.

> "ලෝකයේ වාසය කරනු ලබන මනුෂ්‍යයන් අතර ඇති වන්නා වූ සුවයෙන් හෝ දුකින් යුක්ත වූ කිසියම් අවස්ථාවක් (Situation) අනුකරණය කර දැක්වීම 'නාට්‍යය' යැයි 'නාට්‍ය ශාස්ත්‍ර' (ක්‍රිස්තු පූර්ව 200 - ක්‍රිස්තු වර්ෂ 200 පමණ) කෘතියෙහි භරත මුනි (ක්‍රිස්තු පූර්ව 200 - ක්‍රිස්තු වර්ෂ 200 පමණ) කීහ (ගම්ලත්, 1989. පි. 12)."

ගම්ලත්ගේ අවධානයට ලක් වන "නාට්‍ය ශාස්ත්‍ර' යනු සංස්කෘත නාට්‍යය විෂය කොට ගත් එහෙත් පෙරදිග ප්‍රාසංගික කලා අධ්‍යයනයෙහිලා පාඨ ග්‍රන්ථයකි. රචනය හා අනුකරණය පිළිබඳව

නාට්‍ය කලා මූලධර්ම මෙහි ඇතුළත් වේ. නාට්‍යකරණ වෘත්තීන්, නිර්මාණකරණයෙහිලා එහි අවශ්‍යතාව, එකී වෘත්තීන් දායක වන ආකාරය මෙහි විමසීමට ලක් කෙරේ. මෙහි ඇතුළත් භරතමුනිගේ 'රස' සංකල්පය යනු රස සහ භාව පිළිබඳ ගැඹුරු මනෝභාව විශ්ලේෂණයකි.

රස නිෂ්පත්තිය මගින් මානව චර්යා පිළිබඳ මනෝ රසායනික ක්‍රියාවලිය පිළිබඳව විශ්ලේෂණයකින් යුක්තය.

"විකාසනය වී යන්නා වූ සිද්ධියක් (Event in progress) අනුකරණය කිරීම 'නාට්‍යය' නම් වන්නේ යැයි 'කාව්‍ය ශාස්ත්‍ර' (ක්‍රිස්තු වර්ෂ 335 පමණ) කෘතියෙහි ඇරිස්ටෝටල් (ක්‍රිස්තු පූර්ව 384 - 322 පමණ) ගුරුහු කීහ (ගම්ලත්, 1989. පි. 12)."

ගම්ලත් අවධාරණය කරන "කාව්‍ය ශාස්ත්‍රය' (*De Poetica*) යනු පරිච්ඡේද 26කින් යුතු 'අපරදිග සාහිත්‍ය විචාරයේ ආදී කර්තෘ ඇරිස්ටෝටල් සිය ජීවිතයේ අවසන් භාගයේ ලියූ සාහිත්‍යය සහ කලාව පිළිබඳ ග්‍රීක බසින් කළ ග්‍රන්ථයකි. තමන් ජීවත් වූ යුගය දක්වාම 'සාහිත්‍යය' යන්න නිර්වචනය නොවූ පසුබිමක ඒ වෙනුවට 'කාව්‍යය' යන්න යොදා වීර කාව්‍යය, ශෝකජනකය, හාස්‍යජනකය හා වෘන්ද ගායනය ඇරිස්ටෝටල් විසින් කාව්‍යය ලෙස සිවුවැදෑරුම් කොට දැක්වීය. නිර්මාණකරණයෙහිලා, ශිල්ප ධර්ම පද්ධතියක් උදෙසා රචිත බව ග්‍රන්ථාරම්භයෙහි සඳහන් වෙතත්, පසුකාලීනව වඩවඩාත්, සාහිත්‍ය කලා විචාර සිද්ධාන්ත විකාශනයෙහිලා මෙය හේතු වී තිබේ. ප්‍රවර්ග පිළිබඳව මූලික අධ්‍යයනයද මෙහි අන්තර්ගතය. ඇරිස්ටෝටල් විසින් තම සිසුන්ට පැවැත්වූ දේශන සටහන්වල ස්වරූපය ගන්නා"කාව්‍ය ශාස්ත්‍රය' අද්‍යතන නාට්‍ය විචාරයේදී ඉතා වැදගත් වන පාඨ ග්‍රන්ථයකි.

සුචරිත ගම්ලත් (1989) විසින් පළ කරන ලද **බටහිර නාට්‍ය හා රංග කලාව** කෘතියෙහි **නාට්‍යය** යනු කවරක්දැයි විස්තර කරනු ලබන්නේ මෙසේය.

"කලාවන් (Arts) අතරින් කතා කලාව (Rhetoric) මඟින් කෙරෙන්නේ යම් සිද්ධියක් වූ බව කීම ය. කතා කලාව තිබෙන්නේ තමන්ටම කියවීමට හෝ අන්‍යයෙකු කියවනු අසා සිටීමටය. ඇසිය යුතු කලාව යන අර්ථයෙන් කතා කලාව 'ශ්‍රව්‍ය කාව්‍ය' නම් වේ. නාට්‍යය (Drama) නම් බැලිය යුතු කලාවකි. නාට්‍ය කලාවට 'දෘශ්‍ය කාව්‍ය' යන නම පරිහරණය වන්නේ අනුකරණය (Imitating) කර පෙන්වනු ලබන කලාව යන අර්ථයෙනි. 'රූපක' හෝ 'රූප' යනුවෙන්ද නාට්‍ය කලාව හැඳින්වෙන්නේ මෙම අර්ථයෙන්මය. අනුකරණය යනු මානවයාගේ සහජ ආශයකි (ගම්ලත්, 1989. පි. 12)."

සුචරිත ගම්ලත් (1989) විසින් පළ කරන ලද **බටහිර නාට්‍ය හා රංග කලාව** කෘතියෙහි **නාට්‍යය** යනු කවරක් දැයි නෘත්ත, නෘත්‍ය යන සංකල්ප ඇසුරෙන් හඳුන්වා දෙනු ලබන්නේ මෙසේය.

"**නෘත්ත** යනු ශුද්ධ නැටුමයි. එහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය නම් කිසියම් රිද්මයකට අනුකූලව අතපය යනාදී අංග චලනය කිරීමයි. එහෙත් මෙම රිද්මයානුකූල අංග චලනයෙන් කිසියම් අර්ථයක් ප්‍රකාශනය වන්නේ නැත. නෘත්තයෙහි ඇත්තේ රිද්මය පමණක්ය.

"**නෘත්‍ය** යනු භරත නාට්‍යම්, උඩරට නැටුම්, පහතරට නැටුම්, මනිපුරි නැටුම් යනාදියයි. නෘත්තයෙහි තිබෙන රිද්මයානුකූල අංග චලනය නෘත්‍යයෙහි ඇතත්, එමගින් අර්ථ ප්‍රකාශ කරයි. අර්ථ ප්‍රකාශ කිරීමට මුද්‍රා නිරූපණය යොදා ගැනීම මඟින් ආලය, ශෝකය, භය, ලජ්ජාව වැනි මනෝභාවයක් ප්‍රකාශනය වෙයි.

"නාට්‍ය යේ **නෘත්ත** යේ සහ **නෘත්‍ය** යේ ඇතැයි යට කී රිද්මයානුකූල අංග චලනය, අර්ථ ප්‍රකාශ කිරීමට මුද්‍රා නිරූපණය, සහ මනෝභාව ප්‍රකාශනය තිබෙයි. එහෙත් නාට්‍යයක් බවට පත් වන්නේ එහි චතුර්විධ අභිනය (Gesture)තිබුනොතින්ය (ගම්ලත්, 1989. පි. 09)."

සුචරිත ගම්ලත් (1989) විසින් පළ කරන ලද **බටහිර නාට්‍ය හා රංග කලාව** කෘතියෙහි තවදුරටත් විස්තර කරන්නේ කිසියම් රචකයකු ලියා ඇති නාට්‍ය පෙළ නොහොත් පඨිතය (text) තුළ ගැබ්වන්නා වූ අන්තර්ගතය ප්‍රේක්ෂකත්වය වෙත පැමිණවීම සඳහා අධ්‍යක්ෂවරයාගේ, නළුනිළියන්ගේ හා අන්‍ය ශිල්පීන්ගේ මූලද්‍රව්‍ය ලෙස පරිහරණය කරනු ලබන මාධ්‍ය වන්නේ අභිනය බවය.

"ශත වර්ෂ ගණනාවක් තිස්සේම නාට්‍ය රචනා කර ඇත්තේ ප්‍රයුංජනය (Produce) කර රඟ දක්වනු (Performance) සඳහාය. එහිදී සිදු වන කිසි යම් චරිතයක් අනුකරණයේදී නළුවා එම චරිතය තමා වෙත ආරෝපණය කර ගැනීම 'සමාරෝපය' (Impersonation) ලෙස හැඳින්වේ. ප්‍රේක්ෂකයන් (Audience) අබියස නාට්‍ය පෙළ (Text) ජීවමාන බවට පත් කරන්නේ **ආංගික අභිනය, වාචික අභිනය, සාත්වික අභිනය** සහ **ආහාර්ය අභිනය** යන සතර අභිනය වහල් කර ගැනීමෙනි (ගම්ලත්, 1989. පි. 11)."

එනම්, මනෝභාව ප්‍රකාශනයක් අරමුණු කොට ගෙන, අර්ථ ප්‍රකාශනයෙහි සමත් වන රිද්මයානුකූල අංග චලනය මෙන්ම මුද්‍රා නිරූපණය ඇතුළු සතර අභිනය යොදා ගෙන, සමාරෝපය ඇසුරෙන් අනුකරණයට වැද, කිසියම් පෙළක් ජීවමාන කරවා, නාට්‍ය ප්‍රේක්ෂකයන් වෙනුවෙන්, සෞන්දර්යාත්මක ප්‍රකාශනයක් උදෙසා, නාට්‍ය හා රංග කලා තාක්ෂණය සහ ශිල්ප ධර්ම ඇසුරෙන්, නිර්මාණාත්මකව නිෂ්පාදනය කරනු ලබන සංස්කෘතික කර්මාන්තයක ක්‍රියාවලියක් ලෙස 'නාට්‍යය' යන්න වටහා ගත හැකිය.

මේ අනුව 'ටෙලි නාට්‍යය' යනු, 'ටෙලිවිෂන් මාධ්‍යය' සහ 'නාට්‍ය' යනාදී එකිනෙකට වෙනස් විෂයයන් දෙකක සම්මුඛ වීමක් මගින් සිදු වන ගතිකමය විපර්යාසයක් වන බැවින්, මනෝභාව ප්‍රකාශනයක් අරමුණු කොට ගෙන, අර්ථ ප්‍රකාශනයෙහි සමත් වන රිද්මයානුකූල අංග චලනය මෙන්ම මුද්‍රා නිරූපණය ඇතුළු සතර අභිනය යොදා ගෙන, සමාරෝපය ඇසුරෙන් අනුකරණයට වැද, කිසියම් පෙළක් ජීවමාන කරවා, ටෙලිවිෂන් ප්‍රේක්ෂකයන් වෙනුවෙන්, ටෙලිවිෂන් මාධ්‍යය උදෙසා, ටෙලිවිෂන් මාධ්‍ය තාක්ෂණය සහ ශිල්ප ධර්ම ඇසුරෙන්, නිර්මාණාත්මකව නිෂ්පාදනය කරනු ලබන සංස්කෘතික කර්මාන්තයක ක්‍රියාවලියක් ලෙස 'ටෙලිවිෂන් මාධ්‍යය උදෙසා නාට්‍යය' යන්න වටහා ගත හැකිය.

### 2.1.3 නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් 'ටෙලි නාට්‍යය' අධ්‍යයනය කිරීම

නිර්වචනයක් සම්පාදනය පිණිස මූලික පියවර දෙක ලෙස සංකල්ප වශයෙන් **'ටෙලිවිෂන් මාධ්‍යය'** සහ **'නාට්‍යය'** අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පරිපාකයට පත් වන අවසන් පියවර වශයෙන් **නිර්වචනයක් සම්පාදනය පිණිස සංකල්පයක් වශයෙන් 'ටෙලි නාට්‍ය' අධ්‍යයනය කිරීම** පිණිස පෙර කී ශාස්ත්‍රීය අධ්‍යයන සමඟ සමාග්‍රහණය කළ හැකි දේශීය ශාස්ත්‍රඥයන් තිදෙනකු වූ මාර්ටින් වික්‍රමසිංහ (1945), සුචරිත ගම්ලත් (1989), එදිරිවීර සරච්චන්ද්‍ර (1995), සහ ධර්මසේන පතිරාජ (2017), විසින් විවිධ අවස්ථාවල සම්පාදනය කරන ලද විද්වත් ශාස්ත්‍රීය අධ්‍යයන මෙහිලා මූලයන් වශයෙන් මාර්ගෝපදේශනයෙහිලා පාදක කොට ගැනිණ.

ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි ප්‍රකටව ව්‍යවහාර වන '**ටෙලි නාට්‍යය**' යන්න ඉංග්‍රීසි භාෂාවේ 'Tele Drama' නමැති යෙදුම කෙරෙන් නිපදවුණු බවක් ප්‍රකට මතයක් පවතී. එහෙත් Tele Drama' නමැති යෙදුම තවමත් ඉංග්‍රීසි භාෂාවට ආගන්තුක යෙදුමකි. ටෙලිවිෂන් මාධ්‍යය යොදාගෙන නාට්‍යමය වැඩසටහන් නිපදවීම සඳහා ඉංග්‍රීසි භාෂාවේදී '**ටෙලිවිෂන් මාධ්‍යයේ නාට්‍ය**' 'Drama in Television Medium' යන්න හෝ '**ටෙලිවිෂන් සමඟ නාට්‍ය**' 'Drama with Television' යන්න හෝ, වඩාත් විශේෂිතව '**ටෙලිවිෂන් මාධ්‍යය උදෙසා නාට්‍ය**' 'Drama for Television Medium / Drama for Television' යන්න භාවිතයේ පවතින තත්ත්වයයි. ඒ කෙසේ වෙතත්, '**ටෙලි නාට්‍යය**' යන සිංහල පදය සංකල්පනයෙහිලා '**ටෙලිවිෂන්**' සහ '**නාට්‍ය**' යනාදී එකිනෙකට වෙනස් වූ ඉංග්‍රීසි පද දෙකක් (02) සුසංයෝග වන බවක් බැලූ බැල්මට පෙනී යයි.

පෙරදී නම් සඳහන් කළ දේශීය ශාස්ත්‍රඥයන් අතුරින් පළමුවෙන් ධර්මසේන පතිරාජ (2017) විසින් සිය **සිංහල නාට්‍යයේ ආකෘතිය හා අන්තර්ගතය අතර අරගලය** කෘතියෙහි සිදු කරන ලද මෙම විග්‍රහාත්මක අධ්‍යයනයට අවධානය යොමු කළ හැකිය.

> "ඕනෑම කලා ආකෘතියක් යනු කලාකරුවාට පරපුරින් ලැබෙන්නකි. කලා නිර්මාණයට පෙර එය පවතී. 'සම්ප්‍රදාය' යන නමින් ද හැඳින්වෙන එය 'කලා විඥානය' යනුවෙන්ද හඳුන්වා ඇත. එක් පසෙකින් මේ චිරාගත ආකෘතිය පවත්නා අතර, අනෙක් පසින් නිරතුරු චලනය වන්නා වූ යථාර්ථය පවතී. මෙහි යථාර්ථය යනු සමාජ යථාර්ථයයි. මෙය කලා සම්ප්‍රදාය මෙන් නොව ඊට වඩා ගතික ගුණයක් දරන්නකි. චලනය වෙමින් වෙනස් වන්නා වූ යථාර්ථය තමන් ග්‍රහණය කර ගන්නා ලෙස කලාකරුවාට අභියෝග කරයි. පරපුරින් දෙන ලද කලා ආකෘතිය මඟින් මේ භෞතික යථාර්ථය ග්‍රහණය කිරීමට තැත් කිරීමේදී ඒ යථාර්ථයේ පීඩනයෙන් සාම්ප්‍රදායික ආකෘතිය උඩු යටිකුරු වෙයි; ඇතුළත පිටත හැරෙයි; පුපුරා යයි. අවසානයේදී කලා කෘතිය ලෙස එළිදකින්නේ නව යථාර්ථය කලාකරුවා ග්‍රහණය කළ අංශයට අනුකූලව, නව ස්වරූපයක් ගත් ආකෘතියකි. වෙනස් වචනවලින් කිවහොත් කලා කෘතිය යනු නව යථාර්ථය හා විකරණය වූ ආකෘතියේ සමායෝජනයකි' (පතිරාජ, 2017, පි. 09)."

පතිරාජ දැක්වූ ඉහත අදහසට අනුව 'ටෙලි නාට්‍යය' යනු 'ටෙලිවිෂන්' නමැති '**මාධ්‍යය**' තුළ 'නාට්‍ය' නමැති '**කලාව**' විසින් යථෝක්ත සංකල්පනයෙහි අර්ථය මතු කිරීමෙහිලා එකිනෙකා මත අත්පත් කොට ගන්නා ලද නව්‍ය ස්වරූපයක් බව නිර්වචනයෙහිලා පාදක වන සංකල්පයක් වශයෙන් 'ටෙලි නාට්‍යය' යන්න විමර්ශනයෙහිලා අදහස් කොට ගත හැකි වේ.

නොඑසේ නම්, 'නාට්‍යය' නමැති '**අන්තර්ගතය**' කෙරෙන් 'ටෙලිවිෂන්' නමැති '**ආකෘතිය**' තුළ සිදු වන රූපාන්තරණය වීම යනු 'ටෙලි නාට්‍යය' ලෙස සංකල්පනය කළ හැකි වේ.

එමෙන්ම, ටෙලිවිෂන් මාධ්‍යය යනු මූලිකවම ජන මාධ්‍යයක් වුවද, එයම තම ප්‍රකාශන මාධ්‍යය බවට උපයෝගී කොට ගනිමින් 'ටෙලි නාට්‍යය' යන්න 'මාධ්‍ය කලාවක්' වශයෙන් සංකල්පනය වී ඇති බවක්ද පෙන්නුම් කරයි.

එදිරිවීර සරච්චන්ද්‍ර (1995) සහ පසුව (2010) විසින් සිය **කලාව යනු කුමක් ද?** ශාස්ත්‍රීය ලිපියෙහි මෙහිලා විෂයගත වන 'කලාව' යන්න මෙසේ විමර්ශනයට බඳුන් කොට තිබේ.

> "වර්තමාන සිංහල ව්‍යවහාරයෙහි 'කලාව' වශයෙන් හඳුන්වනු ලබන්නේ මනුෂ්‍යයා තුළ රස දනවන, ස්වාභාවික හෝ නිර්මාණ කරන ලද වස්තුවකටය. රසයයි කියනු ලබන්නේ මනුෂ්‍යයාගේ

> චිත්ත චෛතසිකයන් පුබුදුවන කිසියම් නිර්මාණයකි. කිසියම් දුර්ලභ චෛතසිකයක් මනුෂ්‍යයාගේ අන්තරාත්මයෙහි දනවන, ස්වාභාවික හෝ නිර්මිත වස්තුවකට එනම් දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය නිර්මාණයකි. මීට කලා කෘතිය යනුවෙන් ද ව්‍යවහාර කරති. කලාත්මක නිර්මාණයක්, කලාත්මක දර්ශනයක්, කලාත්මක ගීතයක් යනාදී වසයෙනි. මෙහි මුලදී කියන ලද පරිදි, එම නිර්මාණයෙන් මනුෂ්‍යයා තුළ පෙර නුවූ විරූ, අපූර්ව වින්දනයක් ජනිත කරවයි. (සරච්චන්ද්‍ර, 2010, පි. 15-16)."

සරච්චන්ද්‍රගේ දක්වූ මෙකී අදහස විසින් ඉස්මතු කරනු ලබන පරිදි, මනුෂ්‍ය චිත්ත චෛතසිකයන් පුබුදුවමින් "රස" දැනවීමෙහි මෙන්ම, පෙර නුවූ විරූ, අපූර්ව වින්දනයක් සපයාලීමෙහි සමත් වූවක් ලෙසද, ටෙලිවිෂන් මාධ්‍යයෙහිම ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මිතයක් වූද, කලා කෘතියක් ලෙස 'ටෙලි නාට්‍ය' යනුවෙන් අභිනවයෙන් ස්ථාපනය වූ 'කලාවක්' වූයේද යන්න ශාස්ත්‍රීය අධ්‍යයනයෙහි වැදගත් බවද පෙන්වා දෙයි.

සරච්චන්ද්‍ර විසින් ඉහත ඉස්මතු කරනු ලබන පරිදි, 'රස' දැනවීමෙහි සමත් වන්නේ කලාවක් නම්, මාර්ටින් වික්‍රමසිංහ (1945) විසින් සිය **සිංහල සාහිත්‍යයේ නැඟීම** ශාස්ත්‍රීය කෘතියෙහි මෙහිලා විෂයගත වන 'රස' යන්න කවරේ දැයි මෙසේ විමර්ශනයට බඳුන් කොට තිබේ.

> "සිදු වූවක් වුවද අනුමානයෙන් නිපදවූවක් වුවද වස්තු කොට ගන්නා ලද කතා ශරීරයෙහි රචනා විධිය, රස නිෂ්පත්තියට වහල් වන භාව, විභාව, අනුභාව, ව්‍යභිචාරී භාව යන මොවුන්ගේ උචිත භාවය නිසා සිත් ගන්නක් විය යුතුය; හුදෙක් ශාස්ත්‍ර රීතීන්ට වහල් වීමෙන් නොව, රස ඉස්මතු කරන අපේක්ෂාවෙන්ම ප්‍රබන්ධයෙහි මහ හන්දි හා කුඩා හන්දිද ගැළපිය යුතුය; අලංකරණයෙහි හුරු බුහුටි වුවද ප්‍රබන්ධයෙහි රස ආදිය පාඨකයාගේ සිතට නැඟෙන සේ අලංකරණය කරන්නේය. රස නිෂ්පාදනය පිණිසත් මුඛ්‍ය රසයද කතාවද නඟනු පිණිසත් පැරණි කතාවෙන් ගත් දේ හෝ අමුතුවෙන් නිපදවූ දේ හෝ ප්‍රබන්ධයෙහි ඇතුළු කළ යුතු යැයි ආනන්දවර්ධන කියයි. (වික්‍රමසිංහ. 1945. පි. 44 -45)."

'ටෙලි නාට්‍ය' යනුවෙන් අභිනවයෙන් ස්ථාපනය වූයේ ප්‍රබන්ධාත්මක 'කලාව'ක් වූ බැවින්ම ඒ මගින් 'රස' නිපදවීම අරමුණු කොට ගත් බව ඉහත විමර්ශනය තුළින් මනාව පැහැදිලි වේ. 'ටෙලි නාට්‍යය' යනු 'ටෙලිවිෂන් මාධ්‍යය' සහ 'නාට්‍යය' යනාදී එකිනෙකට වෙනස් වූ විෂයයන් දෙකක සම්මුඛ වීමක් මගින් සිදුව පවතින ඉහත කී ගතිකමය විපර්යාසය කවරක් දැයි වටහා ගැනීම සඳහා

- සංකල්පයක් වශයෙන් **'ටෙලිවිෂන් මාධ්‍යය'** නමැති විෂයය පිළිබඳව

සහ

- සංකල්පයක් වශයෙන් **'නාට්‍යය'** නමැති විෂයය පිළිබඳව

විමර්ශනාත්මක ප්‍රවේශ ද්වයය පාදක වේ.

ඒ මගින් නිර්වචනයෙහිලා පාදක වන සංකල්පයක් වශයෙන් 'ටෙලි නාට්‍යය' පිළිබඳව විග්‍රහාත්මක අධ්‍යයනයට එළැඹීම වඩාත් න්‍යායාත්මක පදනම වේ යැයි සැලකිය හැකිය.

**3. සමාලෝචනය**

අධ්‍යයනකාරක සංකල්පයක් වශයෙන් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යන්න හඳුනා ගැනීමෙහිලා අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් සම්පාදනය කරගැනීමේදී 'ටෙලිවිෂන් මාධ්‍යය'ද සහ 'නාට්‍යය'ද යනාදී ප්‍රවේශ ද්වයය සංකල්පමය වශයෙන් විමර්ශනය කිරීම මහඟු පිටුබලයක් විය.

මූලික වශයෙන් යථෝක්ත ප්‍රවේශ ද්වයය ඇසුරෙන් අනතුරුව ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' පිළිබඳව සිදු කළ සංකල්ප විමර්ශනයට අනුව අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචන දෙකක් පහත දක්වා ඇති පරිදි සම්පාදනය කරගත හැකි වේ.

පළමුවෙනි නිර්වචනය මගින් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යන්නෙහි 'සාංකල්පික පදනම' සහ දෙවෙනි නිර්වචනය මගින් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යයේ ප්‍රායෝගික භාවිතය' අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචන වශයෙන් විග්‍රහ කෙරේ.

### 3.1 ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යන්නෙහි 'සාංකල්පික පදනම' වටහා ගැනීම පිණිස අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් යෝජනා කිරීම

පහත දැක්වෙන පළමුවෙනි නිර්වචනය මගින් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යන්නෙහි 'සාංකල්පික පදනම' අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් වශයෙන් විග්‍රහ කෙරේ. එය මෙසේය.

> "ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යනු 'ටෙලිවිෂන්' නමැති 'මාධ්‍යය' තුළ, 'නාට්‍ය' නමැති 'කලාව', විසින් අත්කර ගනු ලබන ස්වරූපය ලෙසත්, 'නාට්‍යය' නමැති අන්තර්ගතය, 'ටෙලිවිෂන්' නමැති ආකෘතිය තුළ සිදු වන රූපාන්තරණය වීමක් ලෙසත්, විද්‍යමාන වන නිසාම, 'ටෙලිවිෂන්' සහ 'නාට්‍ය' යනාදී වෙනස් විෂයයන් දෙකක සම්මුඛ වීමක් මගින් සිදු වන ගතිකමය විපර්යාසයකි (දිසානායක බණ්ඩාර. 2020. පි. 55)."

### 3.2 ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යයේ ප්‍රායෝගික භාවිතය' වටහා ගැනීම පිණිස අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් යෝජනා කිරීම

අනතුරුව දැක්වෙන දෙවෙනි නිර්වචනය මගින් ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යයේ ප්‍රායෝගික භාවිතය' යන්න අර්ථ සම්පන්න ශාස්ත්‍රීය නිර්වචනයක් වශයෙන් විග්‍රහ කෙරේ. එය මෙසේය.

> "ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යයේ ප්‍රායෝගික භාවිතය' යනු, මනෝභාව ප්‍රකාශනයක් අරමුණු කොට ගෙන, අර්ථ ප්‍රකාශනයෙහි සමත් වන, රිද්මයානුකූල, අංග චලනය සහ මුද්‍රා නිරූපණය ඇතුළු සතර අභිනය යොදා ගෙන, සමාරෝපය ඇසුරෙන් අනුකරණයට වැද, කිසියම් පෙළක් ජීවමාන කරවා, ටෙලිවිෂන් ප්‍රේක්ෂකයන් ඉදිරියෙහි රඟ දැක්වීමක් වෙනුවෙන්, ටෙලිවිෂන් මාධ්‍යය උදෙසා නාට්‍ය නිර්මාණයක්, ටෙලිවිෂන් මාධ්‍ය තාක්ෂණය සහ ශිල්ප ධර්ම ඇසුරෙන්, නිෂ්පාදනය කරනු ලබන සංස්කෘතික කර්මාන්තයක් වූ ක්‍රියාවලියකි (දිසානායක බණ්ඩාර. 2020. පි. 56)."

ශ්‍රී ලාංකේය 'ටෙලි නාට්‍යය' යන්න ඇසුරෙහි හෝ එය අධ්‍යයනකාරකයක් වශයෙන් හඳුනාගැනීමෙහිලා සිදු කරන පර්යේෂණ අධ්‍යයන පිණිස උක්ත නිර්වචන ද්වයය පාදක කරගත හැකි බව මෙයින් යෝජනා කළ හැකි වේ.

## පරිශීලිත ග්‍රන්ථ


ගම්ලත්, සුචරිත. (1989). *බටහිර නාට්‍ය හා රංග කලාව*, මරදානः ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක බණ්ඩාර, සෙනේෂ්. (2020). ***අද්‍යතන ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ප්‍රතිපත්ති හමුවේ ඇති වූ ටෙලි නාට්‍ය දෘශ්‍ය කලා ප්‍රවර්ගයේ පරිණාමීය විශේෂතා (1983 - 2013 දශකත්‍රයට විශේෂිත විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්)***, දර්ශනසූරී උපාධි පර්යේෂණ නිබන්ධය. පේරාදෙණියः මානවශාස්ත්‍ර සහ සමාජීයවිද්‍යා පශ්චාද් උපාධි ආයතනය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පතිරාජ, ධර්මසේන. (2017). ***සිංහල නාට්‍යයේ ආකෘතිය හා අන්තර්ගතය අතර අරගලය***, කොළඹः සකසා ප්‍රකාශන.

වික්‍රමසිංහ, මාර්ටින්. (2011). ***සිංහල සාහිත්‍යයේ නැගීම*** (පළමු මුද්‍රණය 1945), රාජගිරියः සරස පෞද්ගලික සමාගම.

සරච්චන්ද්‍ර, එදිරිවීර. (2010). ***'කලාව යනු කුමක් ද?',*** ජයන්ත අරවින්ද සහ තවත් අය (සංස්.). (1995). සමස්ත ලංකා සංගීත හා නාට්‍ය - අවසාන තරග (1995/96) සමරු ප්‍රකාශනය. අධ්‍යාපන අමාත්‍යාංශය. (නැවත පළ කිරීම) සංස්කෘති - විචාර සංග්‍රහය. (2010). 20 කලාපය. අංක 4 සඟරාව. බොරලැස්ගමුව: සංස්කෘති ප්‍රකාශන සංගමය.

Edgerton, Gary R., (2010). ***The Columbia History of American Television***. New York: Columbia University Press.

Hanks, Patrick., (2013). ***Lexical Analysis: Norms and Exploitations***. Massachusetts: MIT Press.

Khun, Annette and Westwell, Guy., (Eds.) (2012). ***Oxford Dictionary of Film Studies***. 1st Edn. Oxford: Oxford University Press.

McLean, Donald F., (2000). ***Restoring Baird's Image***. London: Institution of Electrical Engineers.